WD

**THE WORLD BANK**

Working for a World
Free of Poverty

# NEWS RELEASE

News Release No. 2007//DEC

**Contacts:**
*In Singapore:* **Maya Brahmam (local tel no)**
mbrahmam@worldbank.org
**Phil Hay Global cell (202) 409 2909**
phay@worldbank.org
*TV/Radio:* **Nazanine Atabaki (local tel no)**
Natabaki@worldbank.org
*In Washington:* **Kavita Watsa (202)458-8810**
kwatsa@worldbank.org

## දියුණු වන ලෝකයේ වාර්ධනගත තරුණ ජනගහණය මත ඉහල ආයෝජනය අද අත්‍යාවශ්‍යයි: ලෝක සංවර්ධන වාර්තාව.

**සිංගප්පූරුව 2006 සැප්: මස 16.**

තරුණ ජනගහනයකට (වයස 12-24 අතර) උරුමකම් කියන දියුණුවන ලෝකයේ රටවල් අතරින් තම තරුණ කොටස් හට ඉහල අධ්‍යාපනයක් සෞඛ්‍ය පහසුකම් සහ වෘත්තීය නිපුණතාවයන් ලබා දීම සඳහා වැඩි ආයෝජනයක් කරණ රටවල් විශාල ආර්ථික වර්ධනයක් සහ පහල දරිද්‍රතා දර්ශකයක් ලඟා කර ගැනීමට සමත් වනු ඇතැයි සිංගප්පූරුවේ පැවති ලෝක බැංකුවේ වාර්ෂික සම්මේලනයේදී එළි දැක්වුනු නව ලෝක බැංකු වාර්තාව පවසයි.

අද සංවර්ධනය වන ලෝකයේ ජීවත් වන බිලියන 1.3ක් වන මෙම වර්තමාන තරුණ පරපුර මෙතෙක් ලෝකයේ වාර්තා වී ඇති විශාලතම තරුණ කොටසයි. ඉහත වාර්තාවට අනුව මෙම තරුණ පරපුර මත ඔවුන්ගේ මතු දියුණුව පිණිස වැඩි ආයෝජනයක් සඳහා මෙය ඉතාමත් හොඳ අවස්ථාවක් වන්නේ මොවුන් මෙයට පෙර අයට වඩා බුද්ධිමත් මෙන්ම අධ්‍යාපනික සහ සෞඛ්‍ය අතින් ඉහල තත්වයකින් හෙබි නිසයි. එමෙන්ම වෙනස්වන ජන සංඛ්‍යාලේඛන වලට අනුව ඔවුන් ශ්‍රමිකයන් ලෙස සමාජයට ඇතුලත් වන්නේද අඩු යැපෙන්නන් සංඛ්‍යාවක් සමගයි. කෙසේ වුවත් මෙම මහගු අවස්ථාව පැහැර හැර අදාල තරුණ ජනතාවට ක්‍රියාකාරී පුරවැසියන් වීමට අවශ්‍ය වෘත්තීමය පුහුණුව ලබා නොදුනහොත් ඔවුන් විශාල ලෙස අතරමං වී අසහනයෙන් පීඩා විඳ අවසානයේදී නොයෙකුත් සමාජීය ගැටලු රැසකට මුල පුරනු ඇත.

ලෝක බැංකුවේ ප්‍රධාන ආර්ථික විශේෂඥ සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂක ෆ්‍රැන්සිස් බෝර්ගුයිනන් මහතා මෙසේ පවසයි.
"සංවර්ධනය වන ලෝකයේ ජීවත් වන මෙම විශාල තරුණ කොටස් සංවර්ධන ක්‍රියා වලියෙහි ඉතාමත් ආකර්ෂණීය අවස්ථා මතු කරණ අතරම දරුණු අවදානම්ද ඇති කරයි. ප්‍රමාණාත්මකව විශාල වූ වෘත්තීමය නිපුනත්වයන්ගෙන් සපිරි සහ තමන්ගෙන් යැපෙන්නන්ද අවම වූ ශ්‍රම බලකායක් නිර්මානය වීම මගින් බොහෝ රටවල්හට තම ආර්ථිකයේ විශාල පුබුදුවක් ඇතිකර ගැනීමට අවස්ථාව ලැබේ. නමුත් මෙහි අත්‍යාවශ්‍ය සාධකයක් වන්නේ මෙම

තරුණ කොටස් රැකියා අවස්ථා ලබා ගැනීමට සහ අවශ්‍ය විටක උදා කර ගැනීමට හැකි මනා පුහුණුවක් ලද යුතුයි".

මෙම ලෝක සංවර්ධන වාර්තාවට අනුව ඉහත සඳහන් තරුණ කොටස් ලොව විරැකියාවෙන් පෙළෙන්නන්ගෙන් 50%කට ආසන්න ප්‍රමාණයක් වේ. උදාහරණයක් ලෙස ගතහොත් වසර 2020 වන විට මැද පෙරදිග සහ උතුරු අප්‍රිකාවේ පමණක් රැකියා අවස්ථා මිලියන 100ක් නිර්මාණය කළ යුතුව ඇත. එමෙන්ම මෙම වාර්තාව සම්පාදනය කිරීමේදී කරණ ලද නැගෙනහිර ආසියාවේ, නැගෙනහිර යුරෝපයේ සහ මධ්‍යම ආසියාවේ තරුණ කොටස් පිළිබඳ සමීක්ෂණ පිළිබිඹු කළේ ඔවුන්ගේ ප්‍රධානතම බිය වන්නේ රැකියා අවස්ථා ලබා ගැනීම සහ කායික ආරක්ෂාවයි.

එමෙන්ම මෙම කලාපයේ මිලියන 130ක් පමණ වයස 15-24 දක්වා වූ තරුණ කොටස් හට කියවීමට හෝ ලිවීමට හැකියාවක් නොමැත. ද්විතීය අධ්‍යාපනය සහ වෘත්තීමය නිපුණතාවයන් ලබා ගැනීම ප්‍රායෝගික වන්නේ එම තරුණ කොටස් ප්‍රාථමික අධ්‍යාපනයවත් ලබා සිටිය හොත් පමණි. එමනිසා මේ ක්ෂේත්‍රයන් පිළිබඳව බලවත් පරිශ්‍රමයක් යෙදිය යුතුවේ. එයට අමතරව ඇල්ජීරියාවේ, බංගලාදේශයේ , බ්‍රසීලයේ , චීනයේ , එස්ටෝනියාවේ සහ සැම්බියාවේ, සමාගම් වලින් 20%ක ප්‍රමාණයකටත් වඩා පවසන්නේ තමාගේ ව්‍යාපාරික කටයුතුවලදී ප්‍රධාන මෙන්ම විශාලම ප්‍රතිරෝධය වී ඇත්තේ තම ශ්‍රම බලකායේ අඩු සාක්ෂරතාවය හා අඩු වෘත්තීමය නිපුණතාවයයි. මෙම ප්‍රතිරෝධය අවම කරගැනීමට නම් මෙම තරුණ කොටස් මත වැඩි සැලසුම් සහගත ආයෝජනයන් කළ යුතුය.

මෙම වාර්තාවේ ප්‍රධාන කතෘ සහ ලෝක බැංකුවේ නැගෙනහිර ආසියාව සහ පැසිෆික් කලාපය පිළිබඳ දෙපාර්තමේන්තුවේ මානුෂික සංවර්ධනය පිළිබඳ අධ්‍යක්ෂක මැනී ජිමෙනෙස් මෙසේ පවසයි.
"මෙම අවදානම් මග හරවා ගෙන යථා තත්වයට පැමිණීම සඳහා බොහෝ සංවර්ධනය වන රටවලට ඇත්තේ කුඩා ඉඩ ප්‍රස්ථාවක් පමණි. මක්නිසාද යත් එය කළ යුත්තේ මෙම වාර්තාගත තරුණ කොටස් මැදිවියට ළඟා වී තමා ලද ජන සංඛ්‍යාත්මක ලාභාංශය ගිලිහී යාමට ප්‍රථමයි. මෙය ප්‍රබුද්ධ සමාජ ප්‍රතිපත්තියක් පමණක් නොවේ. සංවර්ධනය වන රටක දුගී බව තුරන්කර ගැනීම සහ තම ආර්ථිකය ඉතා ප්‍රවේගකාරී ලෙස දියුණු කර ගැනීම සඳහා ගත හැකි මහගු තීරණයක් ද වියහැක".

එක් අධ්‍යයනයක් පෙන්වා දුන්නේ 1965-1990 කාල පරිච්ඡේදය තුළ නැගෙනහිර ආසියාව ලතින් ඇමෙරිකාවට වඩා ලද 40%ක ඉහළ වර්ධනයට ප්‍රධාන හේතුපාදකයන් වී තිබුණේ එම කලාපයේ ක්‍රියාත්මක වූ ග්‍රාමීය ආර්ථිකය, වෙළඳාම, අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම් සහ වෘත්තීය නිපුනත්වයන් පිළිබඳ ධනාත්මක ප්‍රතිපත්තීන්ය. එමෙන්ම මෙම කලාපයේ ශ්‍රම වයසින් යුතු ජනගහනයේ ඉහළ යාමද මෙයට හේතුපාදක විය. මෙම ජනසංඛ්‍යාත්මක අවස්ථාව ප්‍රයෝජනයට නොගන්නා රටවල් ලෝක වෙළඳ පොළේ පවත්නා තරගකාරී රටාවෙන් තවත් ඈතට විසි වී යනු නොඅනුමානයි.

තමන්ගේ තරුණ කොටස් තම ජාතික, සමාජයීය හා ආර්ථික ප්‍රස්ථා කෙරෙහි ඉතා විශාල ලෙස බලපෑම් ඇති කරන බවද, එහෙත් තම තාරුණ්‍යයේ දී ඒවා වඩාත් ඵලදායී ලෙස ආයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ ප්‍රබල ගැටලු වලට ඔවුන් මුහුණ දෙන බවද, බොහෝ ප්‍රතිපත්ති සම්පාදකයින් දැන සිටින බව මෙම වාර්තාව ප්‍රකාශ කරයි. තරුණ කොටස් තුළ ආයෝජනය වැඩි කරවිය හැකියැයි සිතිය හැකි උපක්‍රමික ප්‍රතිපත්ති තුනක් ලෝක සංවර්ධන වාරතාව හඳුනා ගනියි. ඒවානම්, (1) අවස්ථා විසරණය (2) හැකියාවන් වර්ධනය (3) දුෂ්කරතා හේතු නිසා හෝ තෝරා ගැනීම් මඳකම නිසා පහත වැටී සිටින තරුණ කොටස් වලට දෙවන අවස්ථාවක් ලබාදීම.
මේවායින් ඔවුන්ගේ සම්පූර්ණ ආර්ථිකයට, සාමාජියීය හා පවුල් ජිවිතවලට බලපාන මූලික හේතූන් වෙත, එනම් අධ්‍යාපනයක් ලබා ගැනීම, රැකියාවක් සොයා ගැනීම, සෞඛ්‍ය සම්පන්නව සිටීම, පවුලක් ස්ථාපිත කරගැනීම හා පුරවැසිභාවයෙහි පුහුණුවීම යනාදිය කෙරෙහි යොමුවක් ඇතිකෙරේ.

අවස්ථා :- ශ්‍රමබලකාය තුළ තරඟ කිරීම සඳහා දියුණු කළ වෘත්තීය පුහුණුව ඔවුන්ට උපකාර කරන අතර වඩා යහපත් අධ්‍යාපනයක් සහ ශරීර සෞඛ්‍යය සඳහා පුළුල් කරන ලද්දාවූ අවස්ථා මගින් තරුණයන්ට තම නවයොවුන් වියේ සිට වැඩිහිටිවියට සුරක්ෂිතව ළඟා වීම සඳහා අවශ්‍ය ජීවන හැකියාවන් මෙමගින් ලබා කරගත හැක. තමන්ගේම වූ අභිවර්ධනය වන ප්‍රජාපාලන ජීවිතයක් සඳහා දේශපාලනය තුළ සහ සමාජ සංවිධාන වල තරුණ දායකත්වය අත්‍යවශ්‍ය මෙන්ම එය මනා රාජ්‍ය පාලනයක් ළඟා කර ගැනීමටද උපකාරී වේ. ඵලදායී ප්‍රජාපාලනයක් කෙරෙහි දායකත්වය සඳහා අවස්ථාව ලබා නොදීම මගින්, දිගුකාලීන කැළඹිලිකාරී කෝලාහාල ඇතිකරන ආර්ථික හා සාමාජයීය ආතතියක් දක්වා මේ තරුණ කොටස්වල ආවේගාත්මක බව විහිදී යා හැක.
නිදසුනක් ලෙස, ශ්‍රී ලංකාවේ දැනට පවතින සිංහල හා දමිළ වර්ගවාදී අරගලයට මූලිකවම පාදක වූයේ, විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළින් සහ අනෙකුත් ප්‍රජා පාලන ප්‍රස්ථා තුළින් දමිළ සිසුයින් ඉවත් කිරීම තුළින් හටගත්තාවූ ආවේගයයි.

හැකියාවන් :- තරුණ කොටස්වලට තොරතුරු සැපයීම සහ ඔවුන්ගේ තීරණ ගැනීමේ හැකියාවන් දියුණු කිරීම (විශේෂයෙන්ම සෞඛ්‍ය සම්පන්නව සිටීම සහ උසස් අධ්‍යාපනය) ඉතා වැදගත් වේ. නිවැරදි තොරතුරු සහ පෙලඹවීම් වලින් සන්නද්ධ වූ විට මේ තරුණ කොටස් තම ජීවිත පිලිබඳව හරි තීරණ ගනු ඇත.

නාගරික මුඩුක්කු මට්ටමේ සහ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන වයස අවුරුදු 12ත් 20ත් අතර යොවුන් දැරියන් සඳහා වූ ප්‍රජනන හා සෞඛ්‍ය තොරතුරු සහ වෘත්තීය පුහුණු සඳහා පැවති වැඩසටහනක් වන "ඉන්දියාවේ වඩා යහපත් ජීවනයක් සඳහා වූ ක්‍රමවේද" නම් වැඩසටහනේ විශ්ලේෂණයට අනුව පෙනීයන්නේ, එම වැඩසටහනට සහභාගී නොවූවන්ට වඩා, සහභාගීවූවන්, ජීවිතයේ වඩා මූලික තීරණ ගැනීමෙහි යෙදෙන බවයි.

දෙවැනි අවස්ථාවන් :- දුෂ්කරතා හේතු හෝ දුර්වල තේරීම් නිසා පහත වැටී සිටින තරුණ කොටස් සඳහා රටවලට ඉලක්ක සහගත වැඩසටහන් අවශ්‍ය වේ. පාසල් නොයාම, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම, සාපරාධී හැසිරීම සහ දිගුකාලීන විරැකියාව මේ හේතූන් විය හැක. සමස්ථයක් ලෙස, සමාජය කෙරෙහි දිගුකාලීන ඵලදායී ප්‍රතිඵල ඇතිකරන තරුණයන් ගේ අනාගතය නැවත ගොඩනැගීම සඳහා මෙවැනි දෙවෙනි අවස්ථා උපකාරී වෙයි. පුනරුත්ථාපනය සඳහා වන පිරිවැය අධිකය. නමුත් තම අභිමුවෙහි දිගුකාලීන ඵලදායී විභවයක් ඇත්තාවූ තරුණ කොටස් වෙනුවෙන් දරන පිරිවැය තුළින් දිනාගත හැකි වාසිය ඉතා විශාලය.

වයස අවුරුදු 18ට අඩු 300,000ක තරුණ පිරිසක් මෑතකදී සන්නද්ධ අරගල වල යෙදුණු බවටත්, තවත් 500,000ක තරුණ පිරිසක් යුධමය හා ඒහා සමාන බල ඇණිවලට බඳවා ගන්නා ලද බවත් වාර්ථාව ප්‍රකාශ කරයි. හමුදාවෙන් මුදාගැනීම සහ පුනරුත්ථාපන වැඩසටහන් අත්දැකීම් මගින් පෙනීයන්නේ, වෘත්තීය පුහුණු මෙන්ම වෛද්‍ය සහ මානසික ප්‍රතිකාර ක්‍රම මගින් තරුණ සටන්කාමීන්ට සිය ජීවන ප්‍රතිස්ථාපනය කරගත හැකිබවයි.

මේ ගැටළු පහසුවෙන් විසඳිය නොහැකි නමුත්, ශුභවාදී ප්‍රතිපත්ති හා මහජන ආයතන මගින් උපකාර ලද්දාවූ තරුණ කොටස් මෙවන් වූ ගැටලුවලට සාර්ථකව මුහුණ දුන්නා පමණක් නොව, සාර්ථකත්වයට ද පත්වූ බොහෝ නිදසුන් පිලිබඳ සංවර්ධනය වෙමින් පවතින රටවල් හා ඒවායේ තරුණ කොටස් මනාව සිතට ගත යුතුය.

2007 ලෝක සංවර්ධන වාර්ථාවේ සම කතෘ හා ලෝක බැංකුවේ යුරෝපා සහ මධ්‍යම ආසියා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආර්ථික විශ්ලේෂකයකු වන මමිතා මූර්ති මෙසේ ප්‍රකාශ කරයි.

"තම කිසිදු ආදිතමයකුට හෝ වඩා අද තරුණ පරපුරට, රූපවාහිනිය, අන්තර්ජාලය සහ සංක්‍රමණය මගින් පිටස්තර ලෝකය සමග ඉතා දියුණු සම්බන්ධතා මෙන්ම අධ්‍යාපනය හා

අත්දැකීම් මතුළු දේශපාලන ව්‍යවසායකත්වයක් පවතියි. මෙමගින් ඔවුන්ට නීතියට අවනත/ නීති ගරුක වූ හෙට දවසෙහි පුරවැසියන් බවට පත්වීමට ප්‍රස්ථාව සලසාගත හැක".

ඔවුන්ගේ දැනුම සහ ස්වභාවික නිර්මාණාත්මක බව හැසිරවීම මගින්, ඔවුන්ගේ පරපුරේ බොහෝ දුරකට පවතින්නාවූ දිගුකාලීන වාසිදායක ප්‍රතිඵල ඇතිකිරීම හා ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම සිදුකළ හැකි බව මූර්ති ප්‍රකාශ කරයි.

*************************

ලෝක බැංකුවේ අන්තර්ජාල මාධ්‍ය විස්තර කවුළුව තුළින් මාධ්‍ය වේදීන් හට වැඩි විස්තර ලබා ගත හැක. http://media.worldbank.org/secure

මෙතෙක් රහස් පදයක් ලබා නොගත් පිළිගත් මාධ්‍ය වේදීන් හට එය අවශ්‍ය ලියාපදිංචි පත්‍රය පුරවා එවීමෙන් ලබා ගත හැක. http://media.worldbank.org/

මෙම වාර්තාව සම්බාධක ඉවත් වන දිනයෙන් පසු අන්තර්ජාලයෙන් ලබා ගැනීමට නම්:

**http://www.worldbank.org/wdr2007**